# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2383/06 - 2024 මැයි මස 06 වැනි සඳුදා - 2024.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 04**

පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත 2013 දෙසැම්බර් මස 11 දින අංක 1840/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මෙහි දැක්වෙන පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇත.

සංශෝධන අංක 01 - 2017 අගෝස්තු මස 16 වැනි දින හා අංක 2032/26 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2018 ජනවාරි මස 04 වැනි දින හා අංක 2052/26 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2019 සැප්තැම්බර් මස 09 වැනි දින හා අංක 2140/4 *අති විශෙෂ ගැසට් පත්‍රය*

1. 7 ඡේදයේ 7.2.2.1 (අ) කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය.

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්

(අ) භාෂාව (සිංහල / දෙමළ/ ඉංග්‍රීසි) සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

(අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු භාෂාව ලෙස සලකනු ලබන්නේ අයදුම්කරු කළමනාකරණ සේවා නිලධාරී සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා ඉදිරිපත්වන භාෂා මාධ්‍යයයි)

2. 7 ඡේදයේ 7.2.2.1 (ආ) කොටසට පසුව පහත සටහන ඇතුළත් විය යුතුය.

*සටහන* : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට සමාන, වෙනත් දේශීය හෝ විදේශීය අධ්‍යාපන ආයතන මගින් පවත්වනු ලබන විභාගයකට පෙනී සිට ලබා ගෙන ඇති සුදුසුකමක් පත්වීම ලබාදීම සඳහා අදාළ කරගැනීම පිළිබඳව අවසන් තීරණය අදාළ අධ්‍යාපන ආයතන වලින් සහ විභාග කොමසාරිස් ජනරාල්වරයාගෙන් තහවුරු කර ගැනීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

EOG 05 - 0036

1A - G 41880 — 05 (2024/05)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*